BreastScreen WA
WA's only accredited screening service

# මැමොග්‍රැෆි පරීක්ෂාව
# සම්බන්ධ සටහන්

Government of **Western Australia**
Department of **Health**

## BreastScreen WA චිකිත්සාගාරය වෙත සාදරයෙන් පිළිගනිමු...

ඔබගේ මැමොග්‍රෑම් පරීක්ෂාවට **පෙර** මැමොග්‍රැෆි පරීක්ෂාව සම්බන්ධ මෙම වැදගත් තොරතුරු කියවා අමුණා ඇති කැමැත්ත දීමේ ආකෘතිය සම්පූර්ණ කරන්න. ඔබට කිසියම් ප්‍රශ්නයක් ඇතිනම්, පරීක්ෂණ ඒකකයේ කාර්ය මණ්ඩලයෙන් විමසන්න. ඔබගේ පරීක්ෂාව ඕනෑම අවස්ථාවක නැවැත්වීමට ඉල්ලා සිටිය හැකි බව සටහන් කර ගන්න.

### පියයුරු පරීක්ෂා වැඩසටහන සම්බන්ධව

පියයුරු පරීක්ෂා වැඩසටහනේ අරමුණ වන්නේ පියයුරු පිළිකා මගින් සිදුවන මරණ අඩුකිරීමයි. පියයුරු පිළිකා අතට දැනීමට තරම් කුඩා අවස්ථාවක හඳුනා ගැනීමට දැනට ඇති හොඳම ක්‍රමය වන්නේ මැමොග්‍රෑමයක් (පියයුරු එක්ස්-රේ) සිදු කිරීමයි. පියයුරු පිළිකාවක් ඉක්මණින් හඳුනා ගන්නා තරමට සාර්ථක ලෙස ප්‍රතිකාර කිරීමේ අවස්ථාව වැඩිය.

BreastScreen WA වැඩසටහනේ අවධානය ඇත්තේ පියයුරු පිළිකා මුල් අවස්ථාවේ හඳුනා ගැනීමවේ. ඔබගෙන් ලබාගන්නා මැමොග්‍රෑමයේ ඇති පියයුරු පිළිකා ලෙස ගණන් නොගැනෙන වෙනස්කම් වාර්තා කරන්නේ නැත.

දැනට ඇති වෛද්‍ය සාක්ෂි අනුව පරීක්ෂාව මගින් වැඩිපුරම ප්‍රයෝජන ලබා ගත හැක්කේ වයස අවුරුදු 50-74 කාන්තාවන් සඳහාය. ඔබට පියයුරු පිළිකා ඇතිවීමට ඇති ඉඩකඩ වයස සමග වැඩිවේ. කාන්තාවන් අතර ඇති පියයුරු පිළිකාවලින් 70% ක් පමණම වයස අවුරුදු 50 හෝ ඊට වැඩි අය අතරේය. නිතිපතා කරන මැමොග්‍රෑම් පරීක්ෂා මගින් මෙම කාන්තාවන් අතර ඇති මරණ 30% කින් පමණ අඩුකර ගත හැක. වයස අවුරුදු 50 ට අඩු කාන්තාවන් හට මැමොග්‍රැෆි පරීක්ෂාව මගින් ලබා ගත හැකි ප්‍රතිලාභ අඩුය.

### මැමොග්‍රෑමය සිදුකරන්නේ කෙසේද?

ඔබගේ උඩුකය යට ඇඳුම (bra) ගලවා පිටතින් ඇති ඇඳුම නැවත ඇඳ ගැනීමට දැනුම් දෙනු ඇත. ඔබට අවශ්‍ය නම්, බැහැර කල හැකි ගවුමක් (disposable gown) ලබා ගත හැක. විශේෂයෙන් පුහුණු කරන ලද කාන්තා විකිරණශිල්පියෙකු විසින් ඔබගේ මැමොග්‍රෑමය ලබාගනු ඇත.

මැමොග්‍රෑමය ලබා ගන්නා අතර ඡායාරූපය පැහැදිලිව ලබා ගැනීමට පියයුරුව තත්පර කිහිපයකට තද කර තබනු ඇත. මෙය තරමක් අපහසුකාරී විය හැක.

සාමාන්‍යයෙන් එක් එක් පියයුරුව ඡායාරූප දෙක බැගින් ගන්නා අතර සමහර විට වැඩි සංඛ්‍යාවක් අවශ්‍ය විය හැක.

### මැමොග්‍රෑමය කියවන්නේ කවුරුන්ද?

ඔබගේ මැමොග්‍රෑමයේ ප්‍රතිඵලය මැමොග්‍රෑම් කියවීම සම්බන්ධයෙන් මනා අත්දැකීම් ඇති විශේෂඥ වෛද්‍යවරුන් (විකිරණවේදීන්) අවම වශයෙන් දෙදෙනෙකුගේවත් එකඟතාවය මත පදනම්වේ. සියළුම මැමොග්‍රෑම් ස්වාධීනව කියවයි. කලාතුරකින්, මුල් විකිරණවේදීන් දෙදෙනා එකඟ නොවන අවස්ථාවක, ඔබගේ මැමොග්‍රෑමය තුන්වන විකිරණවේදියෙකු විසින් කියවයි.

### නැවත එක්ස්-රේ ඡායාරූපයක් ගැනීමට අවශ්‍ය නම් කුමක් සිදුවේද?

බොහෝ කලාතුරකින් ලබාගත් ඡායාරූපය ප්‍රමාණවත් තරමට පැහැදිලි නොමැති අවස්ථාවක විකිරණවේදියා විසින් නැවත එක්ස්-රේ ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිනු ඇත. මෙය කිරීමට අවශ්‍ය නම්, ඔබට නැවත පැමිණෙන ලෙස දන්වා දුරකථන ඇමතුමක් හෝ ලිපියක් ලැබෙනු ඇත. මෙම නැවත ගනු ලබන එක්ස්-රේ පරීෂණ චිකිත්සාගාරයේදී සිදු කරයි.

### ප්‍රතිඵල දැන්වීම

සියල්ල යහපත් නම්, බොහෝ කාන්තාවන් හට දින 14 ක් ඇතුලත දැනුම්දේ. කාන්තාවන් හට වැඩිදුර පරීක්ෂණ සඳහා කැඳවීම අසාමාන්‍ය නොවේ. මෙය අවශ්‍යනම්, BreastScreen WA හි **පියයුරු ඇගයීමේ හෙදිය (breast assessment nurse)** විසින් ඔබට දුරකථනයෙන් කථාකර සාකච්ඡා කර ගනු ඇත. බොහෝ අවස්ථාවල මෙම පරීක්ෂණ මගින් තවදුරටත් පරීක්ෂණ කිරීම අවශ්‍ය ගැටළු ඇති බව නොපෙන්වයි.

මෙට්‍රොපොලිටන් ප්‍රදේශවල පරීක්ෂාවට ලක්වූ කාන්තාවන් හට තවදුරටත් මැමොග්‍රාෆ් පරීක්ෂා හෝ අවශ්‍යනම් වෙනත් පරීක්ෂණ සිදු කල හැකි වැඩසටහන් ඇගයීමේ මධ්‍යස්ථානයක (Program Assessment Centre) හමුවීමක් ලබා දෙනු ඇත.

ප්‍රාදේශීය ජංගම ඒකකයන්හි (Country Mobile Unit) පරීක්ෂාවට ලක්වූ කාන්තාවන් සඳහා, ඔවුන්ගේ පහසුව සඳහා, මෙම මැමොග්‍රාෆ් බැලීම සිදු කරන්නේ ජංගම වෑන්රථයේදීය.

**කරුණාවෙන් සටහන් කර ගන්න:** අනාගතයේදී ගනු ලබන ඡායාරූප සමඟ සන්සන්දනය කිරීමට, BreastScreen WA මැමොග්‍රෑම් තබා ගනී.

**මැමොග්‍රෑම් කොපමණ විශ්වාසවන්තද?**

මැමොග්‍රෑම් මගින් පියයුරු පිළිකාවලින් 90% ක් පමණ දැකිය හැක. සමහර පිළිකා මැමොග්‍රෑම් මගින් දැකිය නොහැක. තරුණ කාන්තාවන් හෝ හෝමෝන ප්‍රතිස්ථාපන ප්‍රතිකර්ම (Hormone Replacement Therapy) ලබන කාන්තාවන් හට වඩා වයසින් වැඩි කාන්තාවන්ට වඩා තද පියයුරු පටක තිබිය හැකි අතර මේ හේතුවෙන් මැමොග්‍රෑමයක් මගින් පිළිකාවක් හඳුනා ගැනීම වඩා දුෂ්කර විය හැක. මේ හේතුවෙන් තරුණ කාන්තාවන්ගේ පිළිකාවක් මැමොග්‍රෑමයක් මගින් බැහැර කිරීමට අපහසු බැවින්, ඔවුන් හට ජීව පටක පරීක්ෂණ (biopsy) ඇතුළු වැඩිදුර පරීක්ෂණ සිදු කිරීමට සිදුවේ.

එසේම මැමොග්‍රෑමයක් පළමුවෙන් කණස්සළුදායක තත්වයක් පෙන්විය හැකි වුවද වැඩිදුර පරීක්ෂණ මගින් බරපතල ගැටළුවක් නැතිබව පෙන්විය හැක.

මැමොග්‍රෑමයක් සිදුකිරීම මගින් පියයුරු පිළිකා වැළැක්විය නොහැකි අතර කල් ඇතිව හඳුනා ගැනීම මගින් සාර්ථක ලෙස ප්‍රතිකාර ලබාදීමේ අවස්ථාව සහතික කරයි.

**මැමොග්‍රෑම් මගින් කිසියම් හානියක් සිදුවිය හැකිද?**

කලාතුරකින් අවස්ථාවක මැමොග්‍රෑමය ලබා ගැනීමේදී සිදුකරන තෙරපුම හේතුවෙන් පියයුරුවල තාවකාලිකව රිදීමක් හෝ සීරීමක් සිදුවිය හැක. මේ මගින් පියයුරු පටකවලට දීර්ඝ කාලීන හානි සිදු නොවේ.

සෑම මැමොග්‍රෑමයක් සිදු කිරීමේදීම ඉතාම අඩු ප්‍රමාණයක විකිරණ ප්‍රමාණයක් භාවිතා කරයි. දැනට ඇති සාක්ෂි මගින් පෙනී යන්නේ මෙම විකිරණවලට විවෘත වීමෙන් සිදුවිය හැකි අවදානම ඉතා අඩු බවයි. මැමොග්‍රෆි පරීක්ෂාව සිදු කිරීමෙන් සිදුවන වාසිය මෙම අවදානම බැහැර කරයි.

තමා ගර්භනී බව සැක කරන කාන්තාවන් සඳහා මැමොග්‍රෑම් ලබා ගැනීම නිර්දේශ නොකෙරේ. ඔබ ගර්භනී විය හැකි නම්, පිළිගැනීමේ නිලධාරී හෝ විකිරණවේදියා හට දැනුම් දෙන්න.

**දැනට පියයුරු ගැටයක් හෝ පියයුරු පිළිබඳ ගැටළුවක් ඇතිනම් කුමක් සිදුවේද?**

ඔබගේ පියයුරුවල ගැටයක්, තණපුඩුවෙන් දියරයක් යන්නේ නම් හෝ පියයුරුවල වෙනත් වෙනසක් දුටුවහොත්, ඔබගේ මැමොග්‍රෑමය ගැනීමට පෙර කරුණාකර විකිරණවේදියා හට දන්වන්න. එසේම ඔබගේ මැමොග්‍රෑමය සාමාන්‍ය වුවද මෙම රෝග ලක්ෂණ සම්බන්ධයෙන් ඔබගේ පවුලේ වෛද්‍යවරයාව හමුවීම වැදගත්වේ.

**මාගේ පවුලේ වෛද්‍යවරයාගේ විස්තර ඔබට ලබා දිය යුත්තේ ඇයි?**

ඔබට හොඳම රැකවරණය ලබාදීම සඳහා, ඔබගේ පවුලේ වෛද්‍යවරයා සතුව ඔබ සම්බන්ධ සියළු සෞඛ්‍යය රැකවරණ තොරතුරු තිබිය යුතුය. ඔබගේ මැමොග්‍රෑමයේ ප්‍රතිඵල ඔහුට/ඇයට යැවීමට අප සතුටුය. මැමොග්‍රෑම් ලබා ගන්නා කාල පරතර අතර, ඔබගේ පියයුරු නිතිපතා පරීක්ෂා කිරීම වැදගත් වන අතර යම් වෙනසක් ඇතිනම් වහාම ඔබගේ වෛද්‍යවරයාට දැනුම් දිය යුතුය. ඔබගේ පියයුරු ඔබගේ පවුලේ වෛද්‍යවරයා ලවා නිතිපතා පරීක්ෂා කරවා ගන්නා ලෙස ඔබට යෝජනා කරමු.